කුමාරි ඒ.ආර්.බී.පී.
PAPER

**ප්‍රියංකර රත්නායකයන්ගේ ''අද වගේ දවසක ඇන්ටිගනී'' නාට්‍යයෙහි ඛේදනීය වීර චරිතය වන්නේ ක්‍රෙයොන් ද ඇන්ටිගනී ද යන්න පිළිබඳ අධ්‍යයනයක්**

ඒ.ආර්.බී.පී. කුමාරි, ලලිත කලා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

ග්‍රීක ට්‍රැජඩි නාට්‍යයකින් දක්වෙනුයේ එහි එන කතා නායකයා හෙවත් ප්‍රධාන චරිතය ඛේදයට පත්වන ආකාරය යි. ඛේදනීය වීර චරිතය බවට පත්වන ඔහු හෝ ඇය ඛේදයට පත්වන්නේ එම චරිතයේ පවත්නා යම්කිසි ප්‍රමාද දෝෂයක් හෝ අත්වැරැද්දක් හේතුකොට ගෙන ය. මෙහි දී ට්‍රැජඩියේ එන ඛේදනීය වීරයා පිළිබඳ සංකල්පය විශ්ලේෂණාත්මක ව විග්‍රහ කර ඇති අතර ඛේදනීය වීර සංකල්පය ගොඩනැගූ ඇරිස්ටෝටල්ගේ විග්‍රහයට මූලික අවධානය යොමු කර ඇත. ඒ සඳහා පාදක කොටගෙන ඇත්තේ ප්‍රියංකර රත්නායකයන්ගේ ''අද වගේ දවසක ඇන්ටිගනී'' නාට්‍යය යි.

මෙම නාට්‍යය ග්‍රීක ට්‍රැජඩි නාට්‍යකරු සොෆොක්ලීස්ගේ ''ඇන්ටිගනී'' නාට්‍යයේ අනුවාදයකි. එහි කතා වින්‍යාසය තුළ හමුවන ප්‍රධාන චරිත දෙක වන්නේ ක්‍රෙයොන් හා ඇන්ටිගනී චරිතයි. ඔවුන් නියෝජනය කරනුයේ නීතිය පිළිබඳ නිවැරදි තර්කානුකූල අර්ථකථන දෙකකි. ඔවුන් ඛේදයට පත්වන්නේ එකිනෙකට ප්‍රතිවිරුද්ධ වූ එම අන්ත දෙකෙහි ගැටීමෙනි. මෙය ප්‍රියංකර රත්නායකයන් විසින් ඔහුගේ නාට්‍ය නිෂ්පාදනය තුළ උලුප්පා දක්වා ඇත්තේ කෙසේ ද? එම චරිත සොෆොක්ලීස්ගේ මුල් කෘතියෙහි එන චරිත හා සමාන ආකාරයේ ඛේදනීයත්වයක් දැකිය හැකිද? ඒ අනුව එම නාට්‍යයේ ඛේදනීය වීර චරිතය ක්‍රෙයොන් ද ඇන්ටිගනී ද යන්න විග්‍රහ කිරීම මෙම අධ්‍යයනයේ මුඛ්‍ය අරමුණයි. මෙම නාට්‍යය නිෂ්පාදනය මාගේ අධ්‍යයනය සඳහා තෝරා ගැනීමට විශේෂ හේතුව වන්නේ එහි ප්‍රධාන චරිත දෙක අද වගේ දවසක වේදිකාගත කළ විට එහි ඇති සුවිශේෂත්වය වෙත අවධානය යොමු කිරීමටයි. එහිදී ප්‍රධාන චරිත දෙක වේදිකාගත කිරීමේදී ප්‍රියංකර රත්නායකයන් දී ඇති අර්ථකථනය කෙරෙහි මූලිකත්වය දීමට බලාපොරොත්තු වෙමි.

මෙම නාට්‍යයේ ඛේදනීය වීර චරිතය ක්‍රෙයොන් යැයි පැවසීමට හැකිවන අතර, ඇන්ටිගනී ද ඛේදනීය වීර චරිතය බව ඊට ප්‍රතිවිරුද්ධ ව අර්ථකථනය කළ හැක. තව ද මොවුන් දෙදෙනා ම ඛේදනීය වීර චරිතයන් ලෙස දැක්විය හැක. අද වගේ දවසක ඇන්ටිගනී නාට්‍ය දර්ශන නැරඹීම, සම්මුඛ සාකච්ඡා සහ ලිඛිත තොරතුරු මගින් මෙහි අදාළ දත්ත එක්රැස් කිරීම සිදු කෙරිණි.

එම දත්ත ඇසුරෙන් මෙම නාට්‍යයෙහි ක්‍රෙයොන් හා ඇන්ටිගනී දෙදෙනා ම දෙආකාරයකින් ඛේදනීය චරිතයන්ට අදාළ වන බව පෙන්නුම් කෙරේ. එනිසා එක් චරිතයක් පමණක් ඛේදාන්ත වීර චරිතය ලෙස නම් කළ නොහැක. ඒ අනුව අද වගේ දවසක ඇන්ටිගනී නාට්‍යය වීර චරිත දෙකක් පවතින නාට්‍යයක් ලෙස නිගමනය කළ හැකි ය.